3 වන පිටෙන්




ආගරපතන, ඩයගම මාර්ග ඒ අතර වෙයි.

## හෝර්ටන් තැන්නේ ඇති විශේෂ ස්ථාන

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ හදවත බඳු හෝර්ටන් තැන්න නරඹන්නකුට එහි ඇති සුවිශේෂ ස්ථාන කීපයක් ම තිබෙනු දකගත හැකියි. ශ්‍රී ලංකාවේ දෙවැනි උසම කඳු වැටිය වන මීටර් 2393ක් උසැති 'කිරිගල්පොත්ත' හෝර්ටන් තැන්නට බටහිර දෙසින් පිහිටා තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ තෙවැනි උසම කඳුවැටිය වන මීටර් 2359ක් උසැති 'තොටුපළකන්ද' පිහිටා තිබෙන්නේ තැන්නෙහි උතුරු කොටසෙහිය. ගවේෂකයකුට හෝර්ටන් තැන්නේ සිට පැය කීපයක් තුළ දී මෙම සුන්දර කඳුමුදුන්වලට යෑමට ද හැකියාවක් තිබේ. ලංකාවේ ප්‍රධානතම ගංගාවන් කීපයකට ම ජල ද්‍රෝණියක් වන හෝර්ටන් තැන්නෙන් වලවේ, කැලණි සහ මහවැලි යන ගංගාවල ප්‍රධාන දිය දහරාවන් වන බෙලිහුල් ඔය, බගවන්තලා ඔය සහ ආගර ඔය ආරම්භ වෙයි. මේ නිසා රට අභ්‍යන්තරයේ ගලා බසින්නා වූ ප්‍රධාන පෙළේ ගංගාවක ආරම්භක උල්පත් දැකීමට අවශ්‍ය නම් ඔබ යා යුතු හොඳම ස්ථානය වන්නේ ද හෝර්ටන් තැන්නයි. හෝර්ටන් තැන්නෙහි ඇති උල්පත් ජලධාරාවලින් පෝෂණය වී ගලා හැලෙන 'බේකර්ස්' දිය ඇල්ල ද හෝර්ටන් තැන්නෙහි ඇති තවත් සුන්දර ස්ථානයකි.

මුහුදු මට්ටමේ සිට මීටර් 2100 - 2300 අතර උසකින් පිහිටා ඇති හෝර්ටන් තැන්න ලෝක ප්‍රකට වී තිබෙන තවත් ප්‍රධානතම කරුණක් වන්නේ තැන්නෙහි පිහිටා ඇති ප්‍රපාතයන් දෙකයි. මීටර් 274 ක් උසැති 'කුඩා ලෝකාන්තය' සහ මීටර් 884ක් උසැති 'මහා ලෝකාන්තය' නැරඹීමට දෙස් විදෙස් සංචාරකයෝ අමතක නොකරති. දවසේ වැඩි කාලයක් තුළ මීදුමෙන් වැසී ඇති ලෝකාන්තය මීදුමෙන් තොරව පැහැදිළිව දක බලා ගැනීමට අවස්ථාවක් ලැබේ නම් එය නරඹන්නන්ට හෝර්ටන් තැන්නෙන් ලැබෙන තිළිණමය අවස්ථාවකි.

හෝර්ටන් තැන්නෙහි සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 15ක් පමණ වුවත් දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි යන කාලයේ දී රාත්‍රිය දැඩි ශීතල වෙයි. බොහෝ විට ඒ කාලයේ දී හිමිදිර උදෑසන 'මල් තුහින' ද දක ගැනීමට අවස්ථාව උදාවෙයි. හෝර්ටන් තැන්න ආශ්‍රිත කඳුවළල්ලට නිරිතදිග, ඊශානදිග සහ අන්තර් මෝසම් වර්ෂාවන් ලැබෙන නිසා නිරතුරුවම වර්ෂා සහිත කාලගුණයක් පවතී. සාමාන්‍යයෙන් හෝර්ටන් තැන්නේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2500ක් පමණ වෙයි.

## හෝර්ටන් තැන්නේ සතුන් හා ශාක විවිධත්වය

ජෛව විවිධත්වය අතින් සුවිශේෂී පරිසර පද්ධතියක් නිර්මාණය කර ඇති හෝර්ටන් තැන්න ශ්‍රී ලංකාවේ බොහෝ ආවේණික සතුන් හා තුරුලතාවන්ට පාරාදීසයකි. කීන, පොල්කටු, මහරත්මල්, වල් කඳුරු සහ බිනර වැනි ශ්‍රී ලංකාවට ම ආවේණික ශාකයන් ද සීතා පේර(සීත පේර), වැල්කපුරු, මහා මීවන, බෝවිටියා, තෙලු, කුරු උණ වැනි ශාක ද තැන්නෙහි බහුලව දකගත හැකියි. පහත් බිම්වල වැවෙන තුත්තිරි ද වගුරු බිම්වල වැවෙන ගවර ද හෝර්ටන් තැන්නෙහි ප්‍රමුඛ පැලෑටි අතර වෙයි. තැනිතලා භූමි අතරින් විශාල භූමි ප්‍රමාණයක් අතීතයේ දී අර්තාපල් වගාව සඳහා යොදාගෙන තිබේ. ඒවායේ 19 වැනි ශත වර්ෂයේ දී මධ්‍යම කඳුකරයේ පිහිටි පශු ගොවිපොළවල් සඳහා අප්‍රිකාවෙන්





ගෙනඑන ලද 'කිකු' නමැති තෘණ වර්ගයේ ආක්‍රමණයක් ද දකගත හැකියි.

20 වැනි ශතවර්ෂය මුල් කාලයේ දී හෝර්ටන් තැන්න ආශ්‍රිතව වල් අලි ජීවත් වූ බවට සාක්ෂි ඇතත් වර්තමානයේ දී වල් අලි තැන්න ආශ්‍රිතව ජීවත් නොවෙති. තැන්නෙහි ජීවත්වන ප්‍රධානම ක්ෂීරපායී සත්වයා වන්නේ ගෝනායි. ශීත දේශගුණික රටාවක් පැවතීම නිසා පුෂ්ටිමත්ව වැඩුණු ගෝනුන් සිය ගණනක් ජීවත් වන 'ගෝන රංචු' හෝර්ටන් තැන්නෙහි සුලබ දසුනකි. ගෝනාට අමතරව දිවියා, වලස් වඳුරා, වැලි මුවා, දඬුලේනා, බළල් දිවියා, වල් ඌරා, හාවා වැනි ක්ෂීරපායී සත්තු ද හෝර්ටන් තැන්නෙහි ජීවත් වෙති. වලස් වඳුරා අපේ රටට ආවේණික ක්ෂීරපායී සත්වයකු වීම ද සුවිශේෂත්වයකි. ලංකාවට ආවේණික හා ආවේණික නොවන උරග, උභයජීවී හා පක්ෂීන් විශේෂ විශාල ගණනක් ද හෝර්ටන් තැන්නෙහි ජීවත් වෙති. ලංකාවට ආවේණික 'අං කටුස්සා' හෝර්ටන් තැන්නෙහි ජීවත් වන අපූර්වත ම ජීවියෙකි. ලංකා පීතකන් කොණ්ඩයා, ලංකා සිතාසියා, ලංකා අරංගයා, අඳුරු නිල මැසි මාරා වැනි ලංකාවට ආවේණික කුරුළු වර්ග රැසකගේ තෝතැන්නක් වන හෝර්ටන් තැන්නෙහි දේශීය කුරුළු වර්ග 52ක් පමණ ද සංචාරක කුරුළු වර්ග 11ක් පමණ ද නිරීක්ෂණය කළ හැකියි. මීට අමතරව තැන්නෙහි ජීවත් වන කෘමි වර්ග ද සිය ගණනකි.

## තැන්නට ඇති අනතුරු

ලෝකයේ පාරිසරික සුන්දරත්ව හා වැදගත්කම අතින් පිරිපුන් හෝර්ටන් තැන්න හේතූන් කීපයක් නිසාම අනතුරට වැටී තිබීම පිළිබඳව ද සැලකිල්ල දක්විය යුතුව තිබේ. කුමන හේතුවක් නිසා හෝර්ටන් තැන්නෙහි ඇති කීන, දඬු වැනි විශාල ශාක මැරී යාමේ තර්ජනයක් පවතී. එය කුමන බලපෑමක් නිසා සිදුවන්නක් ද යන්න පිළිබඳව තවමත් හෙළි නොවුණු කරුණකි. දෙස් විදෙස් සංචාරකයින් නිසා හෝර්ටන් තැන්නට සිදුවන හානිය ද සුළුපටු නොවෙයි. තැන්නට ගෙනයන පොලිතින්, ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය තැන්න තුළ ම දමා යාමත් තැන්නෙහි ඇති වටිනා ශාකවලට හානි කිරීමත්, කැකෝ ගසා පරිසර නිහඬතාවයන් බිඳීමත් බොහෝ සංචාරකයින් අතින් තවමත් සිදුවන ක්‍රියාවන් අතර වෙයි. හෝර්ටන් තැන්නට පොලිතින්, ගිනිපෙට්ටි මත්පැන් ආදිය ගෙන යාම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තහනම් කර ඇතත් වනජීවී නිලධාරීන්ගේ 'ඇස් වසා' තහනම් බඩු තැන්නට ගෙනගොස් ඇති අයුරු අපට දකගත හැකි වූ වාර අනන්තය. විශේෂයෙන් හෝර්ටන් තැන්නෙහි දමා යන පොලිතීන් වැනි අපද්‍රව්‍ය නිසා සිදුවන හානිය ද සුළුපටු නොවෙයි. වරක් තැන්නෙහි මිය ගොස් සිටි දිවියෙකුගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත් වූ අවස්ථාවේ දී හෙළිදරව් වූයේ දිවියා මියගොස් ඇත්තේ පොලිතීන් දවටනයක් කෑම නිසා බවයි. දිවියාගේ ආමාශයේ පොලිතීන් දවටනයක් තිබී හමුවිණි. හෝර්ටන් තැන්න නරඹන ඇතැම් සංචාරකයින් තැන්නෙහි ගින්දර දල්වීම නිසා ද තැන්න ගිනිගත් අවස්ථා ගණනාවක්ම පවතී. ඇතැම් ගිනි තැබීම් නොදනුවත්කම නිසා සිදු වී ඇති සේම ඇතැම් සිදුවීම් හිතාමතා කරන ලද ක්‍රියාවන් බවට ද හෙළිදරව් වී තිබිණි. හෝර්ටන් තැන්නෙහි ප්‍රමුඛ සත්වයා වන 'ගෝනා' දඩමස් වෙළෙන්දන්ට ගොදුරු වුණු අවස්ථා ද ගණනාවකි. තැන්න අවට ඇති ඇතැම් ගොවිපොළවල් හා වෙළෙඳසැල් 'ගෝනමස්' විකිණීම මහා පරිමාණ ජාවාරමක් කරගෙන ඇති අතර ඒ සඳහා ගෝනුන් විශාල වශයෙන් මරා දමති. මෙය ද හෝර්ටන් තැන්නෙහි සිදුවන ප්‍රමුඛ ඛේදවාචකයකි.

හෝර්ටන් තැන්නෙහි ගිනි දැල්වීම, පැළෑටිවලට හා සතුන්ට හානි කිරීම, සතුන් මැරීම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් ද වෙයි.

හෝර්ටන් තැන්න නැරඹීමේ දී අවශ්‍ය කරන ප්‍රවේශපත්‍ර හෝර්ටන් තැන්නෙහි පිහිටා ඇති වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙන් ලබා ගත හැකියි. සංචාරකයින්ට නවාතැන් ගැනීමට සංචාරක බංගලා සහ නවාතැන් ස්ථාන ද කඳවුරු භූමිය ද කලින් කොළඹ ශ්‍රෙගරි පාරේ පිහිටි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් වෙන්කරවා ගත යුතුය.

ලෝකයේ ඉතාමත් සුන්දර පරිසර පද්ධති කීපයෙන් එකක් වන හෝර්ටන් තැන්න ශ්‍රී ලාංකිකයින් වශයෙන් අප සදා සුරැකිය යුතු ස්ථානයකි. හෝර්ටන් තැන්න නැරඹීමේ දී විශේෂයෙන් ම කරුනු දෙකක් පිළිබඳව සෑම දෙනෙකුම සිහි තබා ගැනීම අත්‍යාවශ්‍ය දෙයකි. ඉන් පළමු කරුණු වන්නේ සකස් කළ මංමාවත්වල පමණක් ගමන් කිරීමය. දෙවනි කරුණ වන්නේ 'සේයාරූ හැර කිසිවක් නොගැනීමටත් පා සලකුණු හැර කිසිවක් නොතැබීමත්ය'

**වනජීවී හා පාරිසරික කොරතුරු මධ්‍යස්ථානය**

> ලෝකයේ පාරිසරික සුන්දරත්ව හා වැදගත්කම අතින් පිරිපුන් හෝර්ටන් තැන්න හේතූන් කීපයක් නිසාම අනතුරට වැටී තිබීම පිළිබඳව ද සැලකිල්ල දැක්විය යුතුව තිබේ.